අඹගමුව ප්‍රාදේශීය සභාව - 2013
නුවරඑළිය දිස්ත්‍රික්කය
---------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ඔක්තෝබර් 21 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය.
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට අඹගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිදුකළ භාණ්ඩ සමීක්ෂණය අනුව අස්ථානගතවී ඇති බවට වාර්තා කර තිබූ පුස්තකාල පොත් 5472 ක වටිනාකම වූ රු.578,654 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුස්තකාල පොත් වටිනාකමෙහි ඇතුළත්ව තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබූ රු.166,878ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.
-----------------------------

ගිණුම් විෂයයන් 02කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.450,774ක් වූ අතර, උපයෝගී ලේඛණ අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.365,092ක් වූයෙන් රු.85,682ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු ගිණුම්
--------------------

2013 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ප්‍රාග්ධන ආධාරවල වටිනාකම රු. 68,663,057ක් වූ අතර ඒ තුළ අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයේ වටිනාකම රු.15,663,591ක් වී තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්
---------------------

2013 දෙසැම්බර් 31 දිනට අවු.01ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.26,642,945ක් වී තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා ඇති රු.95,464,000ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි අයිතිය සනාථ කළහැකි ඔප්පු, පැවරුම් නියෝග සහ පිඹුරුපත් ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිම හෝ පිළිගැනීමට හෝ නොහැකිවිය.

1.3.6 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 107 (2) (1) උපවගන්තිය | සමාලෝචිත වර්ෂය තුළදී සභා බලප්‍රදේශයේ පුද්ගලික ඉඩම්වල අනතුරුදායක ගස් ඉවත්කිරීම සඳහා සභා අරමුදලින් වැයවී තිබුණ රු.174,787ක් වෙනුවෙන් එම ඉඩම් හිමියන්ගෙන් අයකරගෙන තිබුණේ රු.4,000ක් පමණි. |
| (ආ). මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ අංක 01/2013 හා 2013 අප්‍රේල් 05 දිනැති චක්‍රලේඛය 04 වන ඡේදය | වාහනය භාවිත කළබව සනාථ කිරීමට ඉන්ධන බිල්පත් හා ධාවන සටහන් ලබානොගෙන මන්ත්‍රීවරුන් 21දෙනෙකුට මසකට රු.2500 බැගින් රු.315,000ක මුදලක් ඉන්ධන දීමනා වශයෙන් 2013 අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා ගෙවා තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,666,978 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,743,642 ක් වී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ). සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය හා සමඟ සැසඳීමේදී රු.6,076,664ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා පහත සඳහන් ආදායම් අඩුවීම් හා වියදම් වැඩිවීම මූලික වශයෙන් හේතුවී තිබුණි.

| පුනරාවර්තන ආදායම | 2013 | 2012 | විචලනය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වරෙන්තු ගාස්තු හා දඩ | 5,809,900 | 6,330,787 | (520,887) | 08.22 |
| වෙනත් ආදායම් | 8,207,841 | 14,011,128 | (5,803,287) | 41.42 |

පුනරාවර්තන වියදම

----------------------

| | | | | |
|---|---|---|---|---|
| වැටුප් හා දීමනා | 35,571,701 | 33,224,758 | (2,346,943) | 07.06 |
| ගමන් වියදම් | 1,706,872 | 1,404,017 | (302,855) | 21.57 |
| සැපයුම් හා උපකරණ | 6,850,416 | 5,576,463 | (1,273,953) | 22.84 |
| ප්‍රාග්ධන වත්කම් හා අළුත්වැඩියා හා නඩත්තු | 6,661,746 | 4,166,422 | (2,495,324) | 59.89 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 1,020,609 | 404,849 | (615,760) | 152.09 |

(ආ). සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් රු.27,845,455ක් ලැබී තිබුණු නමුත් වැටුප් හා දීමනා ලෙස රු.35,571,701ක් ගෙවා තිබුණි. ඒ අනුව සභාවේ ආදායමෙන් රු.7,726,246 ක මුදලක් සභා සේවකයින්ගේ වැටුප් ගෙවීමට වැය කරන අතර, එම මුදල් වැටුප් ප්‍රතිපූර්ණය හැර සභාවේ පුනරාවර්තන ආදායමින් සියයට 32.27 ක වැඩි ප්‍රතිශතයක් ගෙන තිබුණි.

2.3. ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය.

-----------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2013.12.31 දිනට හිඟ

| ආදායම් විෂය | 2013.01.01 දිනට හිඟය | 2013.01.01 දිනට හිඟයෙන් අයකිරීම | 2013 වර්ෂයේ බිල්කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2013.01.01 දිනට පැවති හිඟයෙන් | වර්ෂයේ බිල්කිරීම් වලින් | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 2,063,722 | 917,569 | 5,965,806 | 4,367,633 | 1,146,153 | 1,598,173 | 2,744,326 |
| බදු කුලී | 1,852,127 | 276,841 | 8,388,339 | 7,718,105 | 1,575,286 | 670,234 | 2,245,520 |
| බලපත්‍ර ගාස්තු | 182,421 | - | 3,823,270 | 3,823,270 | 182,421 | - | 182,421 |
| වෙනත් | 4,054,398 | 187,468 | 1,315,921 | 658,446 | 3,866,930 | 657,475 | 4,524,405 |

ඉහත විස්තර අනුව සමාලෝචිත වර්ෂය තුළ මුළු ආදායම් අයවීම සමාලෝචිත වර්ෂයේ සමස්ථ බිල්කළ ආදායම සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායමින් රැස්කර ගැනීමට කළමනාකරිත්වය කටයුතු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය වුණි.

2.3.2 සංචාරක හෝටල් බලපත්‍ර ගාස්තු

-----------------------------------

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිල වෙබ් අඩවියට අනුව සහ බලප්‍රදේශය තුළ එම අධිකාරියේ ලියාපදිංචි කළ හෝ අනුමත කළ හෝටල් 13 පැවතියද විගණන දිනවූ 2013 ඔක්තෝබර් 11 දින වන විට බලපත්‍ර ගාස්තු අයවී තිබුණේ හෝටල් 03කින් පමණි. ඉන් එක් හෝටලයක් සඳහා ව්‍යාපාරය විසින් ඉදිරිපත් කරන ලද පිරිවැටුම පදනම් කරගෙන බලපත්‍ර ගාස්තු අයකරගෙන තිබුණි.

2.3.3 බදු කුලී

--------

1980 දෙසැම්බර් 30 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ 1980 අංක 46 දරන චක්‍රලේඛයේ විධිවිධාන අනුව වසර 05කට වරක් කඩ බදු තක්සේරු සංශෝධනයන් සිදුකර ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කළ යුතු වුවද, වසර 10කට අධික කාලයක් චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් සභාවට විශාල ආදායමක් අහිමිවී තිබුණි. එසේම කඩ කුලියට ලබාගත් අය විසින් ගිවිසුම්වලට පටහැනිව සිදුකළ ක්‍රියාවන් වෙනුවෙන්ද අවශ්‍ය නීත්‍යානුකූල පියවර ගෙන නොතිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේක්ම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.3,506,680ක මුද්දර ගාස්තු හා රු. 3,235,541ක උසාවි දඩ ලැබිය යුතුව තිබුණි.

2.3.5 ප්‍රචාරක දැන්වීම් ගාස්තු

-------------------------

ප්‍රචාරක දැන්වීම් පුවරු සවිකිරීමේදී ඩයලොග් ආයතනයෙන් අයකරන ලද ගාස්තු පමණක් පදනම් කරගෙන ගිනිගත්හේන නගරය අවට ප්‍රදේශය තුළ ස්ථාපිත ප්‍රචාරක දැන්වීම් පුවරු 76ක වර්ග අඩි 5,338ක් වෙනුවෙන් රු.771,700ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.3.6 වෙනත් ආදායම්

-------------------

(i). ගිනිගත්හේන නගරයේ පිහිටා ඇති පොදු වැසිකිළිය හා සම්බන්ධිත කාර්යයන් වෙනුවෙන් රු.93,359ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී සහා අරමුදලින් වැයකර තිබුණ ද ඉකුත් වර්ෂවල මෙන් වැසිකිළිය ටෙන්ඩර් මඟින් බදුදී එමඟින් කිසිදු ආදායමක් සභාවට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii). මස්කඩ 03ක් හා පොදු වැසිකිලි 02ක් 2012 හා 2013 වර්ෂවලට අදාළව බදුදීමෙන් සභාවට අයවිය යුතු රු.133,042ක හිඟ මුදල විගණන දිනවූ 2014 පෙබරවාරි 20 වෙනි දින වනවිටද අයවී නොතිබුණි.

2.3.7 පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු

--------------------------------------

2013 වර්ෂයට අදාළව වෙළඳ බලපත්‍ර ලබාගෙන තිබූ නේවාසික හෝටල්, ආගන්තුක ලැගුම්හල් හා තානායම් ගණයට අයත් ව්‍යාපාර 42ක් සහ පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතුවන ව්‍යාපාර වර්ග 08කට අයත් කර්මාන්ත පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීමකින් තොරව පවත්වාගෙන යන බව විගණනයේදී නිරීක්ෂණය වුවද, ඒවා පවත්වාගෙන යන පුද්ගලයින්ට විරුද්ධව 2000 අංක 53න් සංශෝධිත ජාතික පාරිසරික පනතේ 23 'අ' වගන්තියට අනුව නීතිමය පියවර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යය සාධනය ඇගයීම

----------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවීම තහවුරු කරගැනීම සඳහා භෞතික හා මූල්‍ය කාර්යය සාධනය දැක්වෙන ප්‍රගති වාර්තා හා පාලන වාර්තා පිළියෙල කර නොතිබුණි.

3.2 භෞතික කාර්යය සාධනය

----------------------------

විගණනයට ඉදිරිපත් කළ විස්තර අනුව ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් අරමුණු ඉටුකිරීමට රු.40,911,936 ක වියදමක් දරා තිබුණ ද රජයේ දායකත්වය හා වෙනත් අයහාර මගින් ලැබී තිබුණේ රු.32,701,532 ක් පමණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | රජයේ දායකත්වය | වෙනත් අයහාර | වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සෞඛ්‍ය සේවා | 4,712,532 | 6,521,572 | 21,129,695 |
| භෞතික | 6,150,234 | 3,459,784 | 9,408,013 |
| ජල සේවා | 1,495,908 | 1,431,869 | 4,586,209 |
| පොදු උපයෝගීතා | - | 7,857,418 | 577,256 |
| සුභ සාධන | 903,672 | 168,543 | 5,210,763 |
| | 13,262,346 | 19,439,186 | 40,911,936 |

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා.

-----------------------------------

සභාව විසින් පවත්වාගෙන යනුලබන සේවාවන් අඛණ්ඩව හා කාර්යක්ෂමව කරගෙන යාම සඳහා අනියම්, ආදේශක, හා දෛනික දීමනා මත වැටුප් ලබන නිලධාරීන් දෙදෙනෙකු හා සේවකයින් 81 දෙනෙකු අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් නොවීමෙන් ඔවුන් වෙත වැටුප් හා දීමනා ලෙස රු.1,026,027ක් පමණ මුදලක් මාසිකව සභා අරමුදලින් වැයකිරීමට සිදුවී තිබුණි. මේ හේතුවෙන් සභා බලප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා යොදාගැනීමට තිබූ මුදලින් විශාල ප්‍රමාණයක් වැටුප් සඳහා වැයකිරීමට සිදුව තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 2012 වර්ෂයට අදාළව සිදුකළ භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා පරීක්ෂා කිරීමේදී ප්‍රධාන කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා ගබඩා උපකරණවල තත්‍ය ශේෂය පමණක් දක්වා තිබීම නිසා ඌණතා හා අතිරික්තතා හඳුනාගත නොහැකිවුණි.

(ආ) 2012 වර්ෂයට අදාළව සිදුකළ භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා අනුව මහජන පුස්තකාල 08ක රු.391,421ක් වටිනාකමැති අස්ථානගතවූ පොත් 4,718 හා අස්ථානගතවූ උපකරණවල වටිනාකම ගණන්බලා ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය.

-----------------------------

බගවන්තලාව සෙන්ට් මේරි විද්‍යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් කර්මාන්තය 1:2:3 (3/4) කොන්ක්‍රීට් මිශ්‍රනයෙන් කාණු සෑදීම සඳහා වැඩිපුර කොන්ක්‍රීට් කියුබ් මීටර් 5:3ක වෙනුවෙන් රු.30,502ක් ගෙවා තිබුණි.

3.6 බලය නොලත් ගනුදෙනු

-------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා 132 වගන්තිය යටතේ සභා අරමුදලින් ගෙවීමට නීතිමය ප්‍රතිපාදන සලසා නොමැති කාර්යයක් වූ ප්‍රාදේශීය සභා පෙර පාසැල් හා පෞද්ගලික පෙර පාසැල් 17ක විසිරයාමේ උත්සව සඳහා තෑගි බෙදාදීම වෙනුවෙන් රු.65,427 ක් වැයකර තිබුණි.

3.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාද

---------------------------------------

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් සිදුකරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දීර්ඝ ප්‍රමාදයක් දක්නට ලැබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

4.1 අයවැය පාලනය.

------------------

(අ). සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 06ක සියයට 26 සිට සියයට 95 දක්වාද වියදම් විෂයයන් 05ක සියයට 13 සිට සියයට 100 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ). සමාලෝචිත වර්ෂය සඳහා අනුමත අයවැය ලේඛණයේ ප්‍රතිපාදන වලට අමතරව පරිපූරක අයවැය හා වැය භුවමාරු මගින් ප්‍රතිපාදන සලසා ගැනීමෙන් පසුවද, එම සීමාවන් ඉක්මවා වැය ශීර්ෂ 02ක රු.884,349ක වියදම් දරා තිබුණි.

(ඇ). ආදායම් ශීර්ෂ 04කට අයත් උප අය විෂයයන් 07ක් සඳහා අයවැයගත කළ රු.3,700,000ක් වූ ආදායම් අයවී නොතිබුණි.

(ඈ). ආදායම් ශීර්ෂ 04ක් සඳහා අයවැයගත රු.29,554,850ක් වූ ආදායම් උපයාගැනීමට සමත්වී නොතිබුණි.

4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

--------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 07කට පිළිතුරු සපයා නොතිබුණි.

5. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.
(ආ). අභ්‍යන්තර පාලනය
(ඇ). ආදායම් පරිපාලනය
(ඈ). වත්කම් කළමනාකරණය
(ඉ). ණයගැති ණයහිමි පාලනය.
(ඊ). තොග පාලනය.
(එ). කොන්ත්‍රාත් පරිපාලනය.